# කරුණාවන්තකමට තෑග්ගක්




**ටී.එම්. ලිතුලි තිනේජා තෙන්නකෝන්**

**2 වසර C**

**මහමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

# කරුණාවන්තකමට තෑග්ගක්



**ටී.එම්. ලිතුලි තිනේජා තෙන්නකෝන්**

**2 වසර C**

**මහමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

කෘතියේ නම : කරුණාවන්තකමට තෑග්ගක්

ප්‍රථම මුද්‍රණය : 2023.11.15

කතාව සහ චිත්‍ර : ටී.එම්.ලිතුලි තිනේජා තෙන්නකෝන්

කතෘගේ ලිපිනය : අංක.90, රංගමුව, හතරලියද්ද

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය ්c

පරිගණක අක්ෂර, පිටු සැකසුම හා වර්ණ ගැන්වීම්

අධීක්ෂණය : එච්.එම්.හර්ෂණී එරංග කුමාරී හේරත්

ISBN : 978-624-208-010-9

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සාමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මහපෙන්වීම යටතේ ලේඛනකරනය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්තකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහනයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහභාගී වීමට සිසුන් දිරිමත් කළ අපගේ පාසල් කළමනාකරණ කමිටුවට, සේවකයින්ට, දෙමාපියන්ට, මගේ සිසුන්ට, පරිපාලකයින්ට සහ වෙනත් පාසල්වල ගුරුවරුන්ට මම ස්තූතිවන්ත වෙමි.

විදුහල්පතිනි ශෂිකලා සේනාධීර මිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
**2023 . 11 10**

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට හා අප්පච්චිට, ලොකුඅන්නාට,

සහ අත්තම්මාට බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය යටතේ

මහාමායා බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණිය C පංතියේ

**පී.එම්.ලිතුලි තිනේජා තෙන්නකෝන්** ශිෂ්‍යාව

විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන රේණුකා රාජපක්ෂ ගුරු මෑණියන්ටත්,

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

එම ව්‍යාපෘතියේ නිර්මාපක සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ISBN කේත ලබාගැණීම සඳහා නොමඳ සහයක් ලබා දුන් 4 ශ්‍රේණියේ සතිනි දියණියගේ මව වන

ලුම්බිණි මහත්මියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාට සහ

කියවීමට කැමති සියළු දෙනාට මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.



එකෝමත් එක
කාලෙක
කරුණාවන්ත
ළමයෙක් හිටියා.
ඒ ළමයා හැමෝටම
උදව් කරනවා.



එයා එයාගේ අම්මත්
සමඟ සතුටින් ජීවත්
වුණා.
එක දවසක් අම්මට
ගමනක් යන්න උනා.
ළමයා තනි වුණා.



මේ පුංචි ළමයා රාජ
කුමාරියක් ළඟ
සේවය කළා.
එයාට ගොඩාක් වැඩ
දුන්නා.
එයා කම්මැළි නැතිව
වැඩ කළා. එයාට
හැමෝම කැමතියි.
කාලයක් ගත වුණා.



දවසක් අමුතු ලෙඩක් තියෙන කෙනෙක් ආවා. හැම දෙනාම එයාගේ ලෙඩේ බෝ වෙයි කියලා බය වුණා. කවුරුත් එයා ළඟට ගියේ නෑ.



ඒක දැකපු මේ ළමයා
උදව් කරන්න ගියා.
එයාට සුව වුණා.
ඒත් ඒ ලෙඩේ පුංචි
ගැහැණු ළමයාට බෝ
වුණා.



එයා උදව් කරපු කිසිම

කෙනෙක් එයාට උදව්

කලේ නැහැ.

ඒ ගමේ මිනිස්සු

ගැහැණු ළමයාව

ගමෙන් එලෙව්වා.



ඒත් එයා කළ හොඳ
වැඩ නිසා,
සුරංගනාවියක් ඇවිත්
එයාව හොඳ කරලා
දිව්‍ය ලෝකයට අරන්
ගියා.



එයා සුරංගනාවියත් එක්ක සතුටින් ජීවත් වුණා.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01